# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008-05-30

වේලාව : පෙ.ව.10.35

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | - | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. | ගරු උපසභාපති | - | සුමේද චමින්ද බස්නායක මැතිතුමා |
| 03. | ගරු නගර සභා මන්ත්‍රී | - | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 04. | ගරු නගර සභා මන්ත්‍රී | - | ටී.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 06. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්.ටී.එම්.රූමී මැතිතුමා |
| 08. | ගරු නගර සභා මන්ත්‍රී | - | යූ.එච්.ගාමිණී මැතිතුමා |
| 09. | ගරු නගර සභා මන්ත්‍රී | - | විමලසේන වැවේගෙදර මැතිතුමා. |

**නිලධාරී සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නාගරික ලේකම් | - | ආර්.ඩී.නලීන් පුෂ්ප කුමාර මහතා |

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

අද දින පවත්වනු ලබන්නේ 2008 වර්ෂයේ මැයි මාසයට අදාළ සභා රැස්වීම බවත්, ඒ සදහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා,ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා ලේකම් මහතා හා පුවත්පත් කලාවේදී මහතුන් සියළු දෙනා සාදරයෙන් පිලිගන්නා බව පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, වසර 20 වඩා වැඩි කාලයක් යුද්ධයෙන් බැට කෑ නැගෙනහිර සිංහල,දෙමළ ,මුස්ලිම් ජනතාවට සැබෑ නිදහසක් ඇති කිරීමේ පරමාර්ථයෙන් 2008.05.10 වන දින නැගෙනහිර පළාතේ මැතිවරණයක් පැවැත්වීමට රජය ක්‍රියාකල බව පැවසීය.

වර්තමාන රජයේ ගරු මැති ඇමතිවරුන් සහ ක්‍රියාකාරී සාමාජිකයින්ගේ සහයෝගය ලබාගෙන එම මැතිවරණය පැවැත්වූ බව සදහන් කල ගරු සභාපතිතුමා, එම මැතිවරණයෙන් රජයට විශාල ජයග්‍රහණයක් හිමි වූ බව පැවසීය. එහි ප්‍රතිඵල මත සිංහල/දෙමළ/මුස්ලිම් ජනතාව නියෝජනය වන පරිදි, අමාත්‍යධුරයන් පිරිනමා ඇති බවද දන්වන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයන් මත ක්‍රියාත්මක වන ගම නැගුම,මග නැගුම සංවර්ධන වැඩ සටහන් යටතේ ලක්ෂ 20 ක මුල්‍ය ප්‍රතිපාදනයක් සබරගමුව පළාත් සභාවේ ගරු පළාත් පාලන අමාත්‍ය මොහාන් එල්ලාවල මැතිතුමා මෙම නගර සභාව වෙත වෙන්කර ඇති බවත්, එම වැඩ සටහන් යටතේ ආරම්භ කල සංවර්ධන යෝජනා අතරින් , සංවර්ධන යෝජනා 03 ක වැඩ අවසන් කර ඇති අතර, තව එක් සංවර්ධන යෝජනාවක වැඩ අවසන් කිරීමට නියමිතව තිබෙන බව දැන්වීය.

ඉදිරියේ දී ගම නැගුම සංවර්ධන වැඩ සටහන යටතේ එක් ග්‍රාම සේවා වසමක සංවර්ධන යෝජනාවන් ඉටුකිරීම සදහා ලක්ෂ 05 ක මුල්‍ය ප්‍රතිපාදන ලබාදෙන බව දන්වා තිබෙන බව වැඩි දුරටත් සදහන් කරන ලදී.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ජාතික ඝන අපද්‍රව්‍ය කළමණාකරණ සහායක මධ්‍යස්ථානයේ මුල්‍ය අනුග්‍රහය මත මල අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ පද්ධතියක් ( night soil treatment ) ඉදිකිරීම සඳහා මුල්‍ය අනුග්‍රහය ලබාදිය හැකි බව දන්වා තිබෙන අතර, ඒ සඳහා කඩිනමින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කර එවන ලෙසත්, ව්‍යාපෘතියට වැයවන මුළු පිරිවැයෙන් 25% ප්‍රමාණයක්නගර සභාව විසින් දැරිය යුතු බවත්, ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

දැනට ගලී බවුසරයේ අපද්‍රව්‍ය දිනකට ලීටර් 10000 ක් පමණ බැංකියවත්ත ඉඩමේ දමන අතර, මෙම හේතු නිසා, භූගත ජලය හා මතුපිට ජලය දූෂණයවීමේ විශාල පරිසර හානියක් සිදුවන බවත්, එය වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ඉහත කී පද්ධතිය ඉදිකිරීමෙන් පසු අපද්‍රව්‍ය කාබනික පොහොර සඳහා යොදාගත හැකි බව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ද වාර්තා කර තිබෙන බව පැහැදිලි කර සිටින ලදී.

බලන්ගොඩ සතිපොළ ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් ණය ලබාගැනීමට ඉල්ලුම් කල බවත්, නව බස්නැවතුම්පල සඳහා ගෙවිය යුතු වූ ණය වාරික නොගෙවීම නිසා අදාල ණය මුදල ලබාදිය නොහැකි බව දැන් වූ බව ගරු සභාපතිතුමා සඳහන් කරනලදී. මෙම අසාර්ථක බස්නැවතුම්පල මෙම සභාව වෙත භාරගත නොහැකි බව හිටපු ගරු සභාපතිතුමා වරින් වර දන්වා සිටිය ද, අදාල කොන්ත්‍රාත් ආයතනය වෙත කොටස් මුදල් ගෙවීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ක්‍රියාකර තිබුණු නිසා, මෙම අසාර්ථක බස්නැවතුම්පල මෙම සභාවට භාරගැනීමට සිදු වූ බව පැහැදිලි කරන ලදී. මේ සම්බන්ධව නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ හා දේශීය ණය සහ සංවර්ධණ අරමුදලේ අදාල වගකිය යුතු නිලධාරීන් වගකීම භාර ගත යුතු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

බලන්ගොඩ නගරයේ ඇතැම් පාසල් වල අ.පො.ස. උසස් පෙළ පංතිවල සිසුන් සතියේ පාසල් පැවැත්වෙන දිනවල පෙරවරුවේ උපකාරක පංතිවලට සහභාගී වීම නිසා, අ.පො.ස.උසස් පෙල පංතිවල සිසුන් නොමැති බව දැනගැනීමට ලැබී තිබෙන බව පැවසූ අතර, මේ සම්බන්ධව සොයා බලන ලෙස සබරගමුව පළාතේ ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කිරීම සුදුසු යැයි පවසමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යන ලෙස ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

03. **<u>2008.04.24 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සහා සම්මත කිරීම:</u>**

2008.04.24 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්.රුමීමැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

04. **<u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:</u>**

පසුගිය වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **<u>සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:</u>**

05:01 **<u>වැසිකිලි අපද්‍රව්‍ය ( night soic ) පිරිපහදු කිරීම් පද්ධතියක් සකස් කිරීම:</u>**

ඉහත කරුණට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර තිබූ 2008.05.29 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ජා කල සභාව, දැනට ගලී බවුසරයේ අපද්‍රව්‍ය අක්‍රමවත්ව බැහැරලීම සිදුකරන නිසා, භූගත ජලය දූෂණයවීම හා වැසිකිලි වල උතුරා යාම නිසා මතුපිට ජලය දූෂණය වීම වැලැක්වීම පිණිස ජාතික ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ සහාය ඇතිව නගර සභා අරමුදලෙන් 25% ක මුල්‍ය දායකත්වයක් යොදාගෙන මලාපවහන ප්‍රතිකර්ම පද්ධතියක් සභාව සතු බැංකියවත්ත ඉඩමේ සෑදීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05:02 **<u>වැවර්ලි ජාත්‍යන්තර නෙට්බෝල් තරගාවලිය ඕස්ට්‍රේලියානු තරගාවලිය - 2008</u>**

උක්ත කරුණට අදාළව බලන්ගොඩ,කෙළින් වීදිය, අංක: 17/1 දරණ ලිපිනයේ පදිංචි එච්.පී.කේ.හිමාලී කෞෂල්‍යා යන අය විසින් විසින් ඉදිරිපත් කර ඇති 2008.05.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත කී අය ර/බලන්ගොඩ විද්‍යාලෝක මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක් වන අතර, මැය 2008 ජුලි 01 දින සිට 04 දින දක්වා ඕස්ට්‍රේලියාවේ මෙල්බර් නුවර පැවැත්වෙන නෙට්බෝල් තරගාවලිය සදහා සහභාගීවීමට සුදුසුකම් ලබා ඇති බවත්, ඒ සදහා රු.1.20,000/- ක මුල්‍ය ප්‍රතිපාදනයක් වැයවන අතර, එම මුදල සොයා ගැනීමට අපහසු නිසා, නගර සභාව මගින් මේ සදහා යම් කිසි උපකාරයක් කරන ලෙස ඉහත කී ලිපියෙන් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ජා කල සභාව, අදාල අය බලන්ගොඩ නගර සීමාව තුළ පදිංචි අඩු ආදායම්ලාභි පවුලක ශිෂ්‍යාවක් වන නිසා, 2008 වර්ෂයේ අයවැය ලේඛණයේ වැය ශිර්ෂ 6-5-473-1 යටතේ ශිෂ්‍යාධාර සදහා වෙන්කර ඇති රුපියල් ලක්ෂයක මුදලින් රු.10,000/- ක මුදලක් පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන ඉහත කී ශිෂ්‍යාව වෙත ගෙවීමට ඒකමතිකව තීරණය කරන ලදී.

05:03 **<u>ස්ථාවර තැන්පත් ගිණුම -20091-01-14065( සැ.අ.102708 )</u>**

බලන්ගොඩ නගර සභාව මගින් පවත්වාගෙන යනු ලබන ඉහත සදහන් ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය 2007.12.31 දිනට රු.850000/- ( අට ලක්ෂ පනස් දාහක් ) බව සහතික කරමින් බලන්ගොඩ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කළමණාකාර මහතා විසින් එවා ඇති 2008.05.29 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම සදහා සභාගත කරන ලදී.

05:04 **<u>අක්කර 18 මාර්ගය සංවර්ධනය කිරීම</u>**:

නගර සභා අරමුදල් වැයකර බලන්ගොඩ අක්කර 18 මාර්ගය අඩි 100 ක් දුර සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා, බලන්ගොඩ නගර සභාවේ ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සදහා ඇස්තමේන්තුවක් සකස් කර මෙම මාර්ගය සංවර්ධනය කරදීම සුදුසු බවට සභාව විසින් තීරණය කරන ලදී.

05:05 **<u>නගර සභාවේ ප්‍රයෝජනය සදහා multimeder projector එකක් මිලදී ගැනීම</u>**:

නගර සභාවේ ඵලදායීතාව ඉහල නැංවීම සදහා දැනට පුහුණු වැඩ සටහන් රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, මෙම පුහුණු වැඩ සටහන් විධිමත්ව ක්‍රියාත්මක කිරිම සදහා multimeder projecto එකක් මිළදී ගැනීම සුදුසු බව දන්වමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති 2008.05.30 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

මිළ ගණන් කැදවා ප්‍රමිතියෙන් උසස් ජපානයේ නිෂ්පාදිත Multimeder Projecter එකක් මිලදී ගැනීමට සභාව තීරණය කරන ලදි.

05:06 **<u>ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට ස්ථානයක් ලබාගැනිම</u>**:

උක්ත කරුණට අදාළව, බලන්ගොඩ , කරවිකැටිය අංක:7/6 දරණ ලිපිනයේ පදිංචි එන්.ජේ.ඒ.ඒ.පී.සරත්චන්ද්‍ර යන විසින් එවා ඇති 2008.05.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බලන්ගොඩ , බලගහමුල ඔරලෝසු කණුව ඉදිරිපිට ඔසු කැද අලෙවිසලක් පවත්වාගෙන යාමට අවසර දෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ජා කල සභාව, ඉහත කී අය අඩුආදායම්ලාභියෙකු වන නිසා, මාස 03 ක කාලයකට සහනයක් ලෙස එම ස්ථානයේ උක්ත ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවසරදීම සුදුසු යැයි තීරණය කරන ලදී.

05:07 **<u>ගාස්තු සංශෝධනය කිරීම: ජේ.සී.බී.යන්ත්‍රය/ගලි බවුසරය/ජල බවුසරය:</u>**

වර්තමානයේ වෙළඳපලේ ඉන්ධන මිල වැඩි වී ඇති බැවින්, මෙම සභාව සතු ඉහත සඳහන් වාහන කුලියට ලබාදී සේවාවන් ඉටුකරගැනීමේ දී අයකරනු ලබන ගාස්තු ප්‍රමාණවත් නොවන බව විෂය භාර නිලධාරීන් විසින් වාර්තා කර ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කර සිටින ලදී.

**වාහනය** **පැරණි ගාස්තුව** **වැට්** **සංශෝධිත නව ගාස්තුව** **වැට්**

01. ජල බවුසරය රු.1550/- 232.50 රු.2250/- 337.50
(නගර සීමාව)

02.නගර සීමාවෙන් පිටත යන්නේ නම් කි.මී.01 රු.250/- 37.50 300/- 45.00

03.ජේ.සී.බී.යන්ත්‍රය පැය 01 කට රු.1739/- 261.00 2500/- 375.00

**<u>ගලි බවුසරය:</u>**

| ස්ථානය | ලෝඩ් 01 ඉවත් කිරීමට | ප්‍රවාහන ගාස්තු | අවසාන බැහැරලීම | වැට් | එකතුව |
|---|---|---|---|---|---|
| නගර සීමාව තුළ 01. නිවාස/පාසල්/ආගමික ස්ථාන/පුන්‍යායතන | 900/- | 1250/- | 500/- | 397.50 | 3047.50 |
| 02. ව්‍යාපාරික/රජයේ හා කර්මාන්ත | 1200/- | 1250/- | 1000/- | 517.50 | 3967.50 |
| නගර සීමාවෙන් පිටත 03. නිවාස/පාසල්/ආගමික ස්ථාන | 1200/- | කි.මී.01 රු.100/- | 1000/- | 15% | |
| 04. රජයේ ආයතන/කර්මාන්ත හා ව්‍යාපාරික ස්ථානය | 1850/- | කි.මී.01 කට රු.100/- | 1000/- | 15% | |

මෙම ගාස්තු වලට අමතරව නගර සභා සීමාවෙන් පිටත සේවා සඳහා රු.1450/- ක යැවීම් දීමනාවක් අයකිරීමට ද තීරණය කරන ලදී.

සභාව සතු ඉහත සඳහන් වාහන සඳහා 2008.06.01 දින සිට සංශෝධිත නව ගාස්තු අයකිරීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

05:08 **<u>ව්‍යාපාරික ස්ථානය ඉදිරිපිට නවතා ඇති ට්‍රිපර් රථය ඉවත්කරගැනීම:</u>**

බලන්ගොඩ පැරණි බස්නැවතුම්පල යන ලිපිනයේ පදිංචි ටී.එම්.චන්ද්‍රලාල් , කේ.එම්.නිමල් කරුණාරත්න යන අය විසින් ඉදිරිපත් කර ඇති 2008.05.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

තමන්ගේ වෙළඳසල ඉදිරිපිට ටිපර්,රථවාහන නවතා තැබීම නිසා සිය වෙළඳසලට ආදායමක් නොමැති බවත් එම නිසා, එම වාහන වෙනත් ස්ථානයට යොමු කරන ලෙස එම ලිපියෙන් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

බලන්ගොඩ දොරවෙල ගල්වල පිහිටි ඉඩමෙහි එම වාහන නවතා තැබීමට ඉඩකඩ ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:09 **<u>පළාත් පාලන ආයතනවල කම්කරුවන් සඳහා දින 02 ක කසල කළමණාකරණ පුහුණු වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.</u>**

උක්ත කරුණට අදාලව, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාවට ඉදිරිපත් කරන ලදී.

ලංකාවේ පළාත් පාලන ආයතන 260කට වැඩි ප්‍රමාණයකට අද වන විට කසල කළමණාකරණය ගැටළුවක් වී ඇති බවත්, මෙම නගර සභාව විසින් කරනු ලබන ඉහත වැඩ සටහනට ඉතා හොඳ ඉල්ලුමක් , අනෙකුත් පළාත් පාලන ආයතන වලින් ලැබී ඇති නිසා, එම පළාත් පාලන ආයතන වලට මුදල් අයකර පුහුණු පාඨමාලාවක් පැවැත්වීමට යථෝක්ත ලිපියෙන් යෝජනා කර ඇති බවත්, ඒ අනුව අඩුම සහභාගීවන්නන් 10 ද, වැඩිම සහභාගීවන්නන් 30 ක් ද වන පරිදි එක් අයෙකුලෙන් රු.1000/- ක මුදලක් අයකර දින 02 ක පුහුණු පාඨමාලාවක් පැවැත්වීම සුදුසු බව එමගින් වැඩිදුරටත් වාර්තා කර තිබෙන බව ලේකම් මහතා සභාව වෙත දැණුම් දෙන ලදී.

ඉහත ලිපියෙන් ඉල්ලා ඇති පරිදි එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:10 **<u>නගරයේ රථ වාහන නැවතුම් ස්ථාන වලින් මුදල් අයකිරීම:</u>**

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් 2008.04.11 දින සිට 21 දින දක්වාත්, වෙසක් උත්සව දිනවල 19 දින සිට 23 දින දක්වාත් නගරයේ රථ වාහන නැවතුම් ස්ථාන වලින් නැවතුම් ගාස්තු අයකිරීම අඩු වු බැවින්, එම කාලය තුළ ආදායම් එකතු කිරීමට නොහැකි වු බවත්, ඒ සම්බන්ධව සාධාරණයක් ඉටුකරදෙන ලෙසත්, ප්‍රමාද ගාස්තු වශයෙන් අයකරන මුදල නිදහස් කරදෙන ලෙස ඉල්ලා, ජේ.රත්නායක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාවට ඉදිරිපත් කරන ලදී.

දින 07 ක මුදල් අඩුකර ඉතිරි මුදල් අයකරගැනිමටත්, ප්‍රමාද ගාස්තු වලින් නිදහස් කිරීමටත් සභාව තීරණය කරන ලදී.

05:11 **<u>පිවිසුම් මාර්ගය අබලන් කිරීම:</u>**

කුමාරගම හන්දියේ සිට කුමාරගම තලංගම රන්දොල හා රන්දොල උයනගම ආදී ගම්මාන රැසකට යන මාර්ගය කිහිපදෙනෙකුගේ නොමනා ක්‍රියාකලාප නිසා අබලන් වී ඇති බැවින්, ඒ සම්බන්ධව සොයා බැලීමට මැදිහත්වන ලෙස ඉල්ලා ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර ඇති 2008.05.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් ලබාදෙන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත හා වැඩ අධිකාරී මහතා වෙත දැණුම්දීමට තීරණය කල සභාව, එම උපදෙස් පිළිනොපදින්නේ නම්, නීත්‍යානුකුල පියවර ගැනීම සුදුසු බවට වැඩිදුරටත් තීරණය කරන ලදී.

05:12 **<u>නගර සභා පොදු වෙළඳසල පිටුපස කාණුව සම්බන්ධවයි:</u>**

බලන්ගොඩ නගරයේ නව කාණු පද්ධතිය ඉදිවෙමින් පවතිද්දී පූර්වෝක්ත කාණුව මැනවින් සකස් නොකිරීම නිසා, පරිසර හා සෞඛ්‍ය ගැටළු රැසක් නිර්මාණය වී තිබෙන බවත්, මැසි මදුරුවන් බෝවීමේ සීග්‍රතාවය දුර්ගන්ධය වැනි ජන පීඩන රැසක් මතුව තිබෙන අතර, හාත්පස පදිංචි නිවෙසේ වල පැවැත්මට ද තරජණයක් වන උක්ත කාණුව ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ඉල්ලා බලන්ගොඩ කෙලින් වීදිය අංක: 49 දරණ ලිපිනයේ පදිංචි ටී.එච්.පුජදාස මහතා විසින් ඉදිරිපත් කර ඇති 2008.05.27 දිනැති ලිපිය සභාගත කරනලදී.

කාණුව ගැඹුරු කර ඉදිකරදීමට තීරණය කල සභාව, මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස කාර්මික නිලධාරී මහතා වෙත දැණුම් දීමට තීරණය කරන ලදී.

05:13 **<u>ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම:</u>**

බලන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම ගරු වාරිමාර්ග අමාත්‍ය ජයතිස්ස රණවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2008.06.02 දින පෙ.ව.10.00 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන බව දන්වමින්, ප්‍රාදේශීය ලේකම්(බලන්ගොඩ) හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ලේකම් විසින් එවා ඇති අංක: ඩීඑස්ඒ/පී/3/6/15 හා 2008.05.21 දිනැති ලිපිය සභාගත කරන ලදුව,

ඉහත දින පැවැත්වීමට නියමිත රැස්වීම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනාවන් තිබේ නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුන්ලා වෙත ගරු සභාපතිතුමා විසින් දැණුම් දෙන ලදී.

05:14 **<u>දේපල ලේඛණ වලින් ඉවත්කිරීම:</u>**

පහත දැක්වෙන දේපල නගර සංවර්ධනය යටතේ 2005 වර්ෂයේ කපා ඉවත් කර ඇති අතර, ලේඛණ වලින් මේ දක්වා ඉවත් කර නොමැති බවත්, එම නිසා එම නම් , අංක හා හිඟ මුදල් ලේඛණයෙන් කපා හැරීම සුදුසු බව විෂය භාර නිලධාරී විසින් වාර්තා කර ඇති බව ලේකම් මහතා සභාව වෙත දැනුම් දෙන ලදී.

| **පාර:** | **වරිපනම් අංකය:** | **නම:** | **හිඟ මුදල:** |
|---|---|---|---|
| **හපුතලේ පාර:** | අංක: 44 | එස්.එච්.වාකිෂ්ඨ | රු. 15452.12 |
| | 44/1 | -එම- | 1983.12 |
| | 44/2 | -එම- | 75.52 |
| | 48 | එම්.එම්.ජෝතිපාල | 2503.99 |
| | 50 | -එම- | 5208.36 |
| | 50/ඒ | ඒ.කේ.ප්‍රේමතිලක | 6420.48 |
| | 50/1 | තුඹගොඩ විහාර භාරකරුවෝ | 13944.00 |
| | 50/2 | -එම- | 179.43 |
| | 54 | රජය | 177.11 |
| දොරවෙල පාර | 02 | පී.එම්.බී.අප්පු | 4364.96 |
| කල්තොට පාර | 23 | පී.එල්ලාවල | 5884.36 |
| | 25 | -එම- | 4358.12 |
| -එකතුව- | | | 46747.00 |

පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන ඉහත කී නම් , අංක හා හිඟ මුදල් ලේඛණයෙන් කපාහැරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:15 **<u>පොහොර මිල සංශෝධනය කිරීම:</u>**

2008.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, කොම්පෝස්ට් පොහොර මිල සංශෝධනය කලයුතු බව යෝජනා කරමින්, මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද 2008.05.27 දිනැති ලිපිය සභාවට ඉදිරිපත්කරන ලදුව, අදාල මිල ගණන් සංශෝධනය කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

01.කි.ග්‍රෑ.50 මිටියක සිල්ලර මිල රු.400/- තොග මිල රු.375/-
02. කි.ග්‍රෑ.25 මිටියක සිල්ලර මිල 200/- තොග මිල රු.175/-
03. කි.ග්‍රෑ.10 මිටියක සිල්ලර මිල රු.125/- තොග මිල රු.100/-
04. කි.ග්‍රෑ.02 පැකට් සිල්ලර මිල රු.40/- තොග මිල රු.30/-
(තොග මිල සඳහා:) අවම මිටි 06 ක්

05:16 **<u>සෝදාපාළු වූ අඩිපාලම සකස් කරගැනීම:</u>**

උක්ත කරුණට අදාළව, බලන්ගොඩ ඇල්ලෙපොල මාලිගාතැන්න යන ලිපිනයේ පදිංචි එච්.ඩබ්.ධර්මදාස මහතා විසින් එවා ඇති 2008.02.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

රත්නපුර.බලන්ගොඩ ප්‍රධාන බස් පාරට මායිම්ව ඇල්ලෙපොල මාලිගාතැන්න යක්එරමුදුකැටිය අලුතින් කොන්ක්‍රීට් දමා සාදා නිමකර ඇති පාරට මුහුණ ලා දැක්වෙන අඩිපාර වැසිජලය ගලායාම හේතුවෙන්, සෝදා පාලුවට ලක්ව ඇති බවත්, මෙම මාර්ගය පවුල් 20 ක් පමණ ගමනාගමනය සඳහා භාවිතා කරන බැවින්, මෙම මාර්ගය කොන්ක්‍රීට්කර අලුත්වැඩියා කරන ලෙස ඉල්ලා ඇත.

මෙම මාර්ගය සංවර්ධනය කරදීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:17 **<u>A-16 කඩ කාමරයේ බදු අයිතිය පැවරීම</u>**:

බලන්ගොඩ බස්නැවතුම්පලේ ඒ.16 දරණ කඩ කාමරය තමා විසින් බදුලබාගත් බවත්, නමුත්, එය පවත්වාගෙන යාමේ දුෂ්කරතාවයක් මත කඩ කාමරයේ බදු අයිතිය තමාගේ ඥාතියෙකු වන බලන්ගොඩ .රත්මලවින්න අංක: 109 සී /8 දරණ ලිපිනයේ පදිංචි ඒ.තිලංග ප්‍රනාන්දු මහතා යන අය වෙත පවරාදීමට කැමැත්ත ප්‍රකාශ කරමින්, එවා ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

බස්නැවතුම්පලේ අංක: A දරණ කඩ කාමරයේ බදු අයිතිය ඊ.තිලංග ප්‍රනාන්දු යන අය වෙත පවරාදීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

5:18 **D-26 දරණ කඩ කාමරය:**
බලන්ගොඩ කල්තොට පාර අංක: 85/3 දරණ ලිපිනයේ පදිංචි ජේ.සරත් ද සිල්වා මහතා විසින් එවා ඇති 2008.05.27 දිනැති ලිපිය සභාගත කරන ලදී.

තමා විසින් බදුගෙන තිබෙන ඉහත අංක දරණ කඩ කාමරය සඳහා ගෙවිය යුතු රු. 147537.97 ක මුදලින් රු.25000/- ක මුදලක් 2008.06.10 වන දිනට පෙර ගෙවීමට පොරොන්දු වන අතර, ඉතිරි මුදල වන රු.122537.97 ක මුදල ගෙවීම සඳහා මාස 03 ක සහන කාලයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබේ.

.මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව මුදල් ගෙවීම සඳහා මාස 03 ක සහන කාලයක් ලබාදීමට තීරණය කරන ල දී.

5:19 **පිළිරුවක් ඉදිකිරීම සඳහා අවසර ලබාගැනීම:**
බලන්ගොඩ කිරිදිගල අංක: 262/2 දරණ ලිපිනයේ පදිංචි පී.බී.සිසිල් යන අය බලන්ගොඩ කතෝලික සුසාන භූමියට ඇතුලුවන තැන කෙළවර ජේසුස් වහන්සේගේ පිළිරුවක් සෑදීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති 2008.05.29 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, මහා මාර්ගයට අවහිර නොවන අන්දමින්, මෙම සභාවේ අනුමත සැලසුමකට අනුව, මෙම පිළිරුව ඉදිකර ගැනීමට අවසර දීමටත්, මේ සඳහා මහජන විරෝධතා තිබේ දැයි විමසා බැලීමටත් තීරණය කරන ලදී.

5:20 **මාර්ගය සංවර්ධනය කිරීම:**
උක්ත කරුණට අදාළව බලන්ගොඩ,කුමාරගම ප්‍රදේශවාසීන් විසින් එවා ඇති 2008.05.30 වන දිනැති ලිපිය සභාගත කරන ලදී.

ජාතික සවිය ,ගම නැගුම 2008 සංවර්ධන යෝජනා අතරින් කුමාරගම වසමේ කුමාරගම ii වන පටුමග මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාව සඳහා රජය විසින් ලක්ෂ 05 ක මුදලක් වෙන්කර ඇති බවත්, නමුත් මේ සඳහා ලක්ෂ හතහමාරක වැඩ පෙන්විය යුතු බවත්, නමුත් එම ප්‍රදේශයේ ගම්වාසීන්ට ඒ සඳහා මූල්‍යදායකත්වය ලබාදීමේ අපහසු තත්ත්වයක සිටින නිසා, පහත දැක්වෙන අන්දමේ දායකත්වයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

| | |
|---|---|
| වැලි කියුබ් | 11 |
| අඩි 2x8 හියුම් පයිප්ප | 02 |

මේ පිළිබඳව ලේකම් මහතා විසින් 50% ක ශ්‍රමදායකත්වය අදාල ප්‍රතිලාභීන් මගින්ම ඉටුකයුතු බව පෙන්වා දෙන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, සභා අරමුදලින් ඉහත කී ද්‍රව්‍ය මිළදීගෙන ලබාදීමටත්, ප්‍රදේශයේ ජනතාවගේ ශ්‍රමදාකත්වය ලබාගෙන මෙම සංවර්ධන කාර්යය ඉටුකරන ලෙස දැනුම්දීමටත් තීරණය කරන ලදී.

5:21 **කිරි අලෙවිකිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම:**
සමෘද්ධි සංවර්ධන වැඩ සටහන යටතේ කිරිඅලෙවිසලක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා පුහුණු ප්‍රතිලාභියෙකු ද මේවන විට තෝරාගෙන ඇති බැවින්, එය පවත්වාගෙන යාම සඳහා සුදුසු ස්ථානයක් හා අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලා බලන්ගොඩ නගර වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරිණිය විසින් එවා ඇති 2008.05.05 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

බලන්ගොඩ ඔරලෝසුව කණුව ඉදිරිපිට නගර සභාව විසින් සාදා ඇති කඩ කාමරයක ඉහත සඳහන් කිරි අලෙවිකිරීමේ මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදීමට සභාව තීරණය කරන ලදී.

5:22 **නිවාඩු දිනවල කොමිස් පදනම මත වරිපනම් බදු අයකිරීම:**

පළාත් පාලන ආයතනවල සේවය කරන ආදායම් පරිපාලකවරුන් රාජකාරි වේලාවෙන් බැහැරව සහ නිවාඩු දිනවල කොමිස් පදනම මත වරිපනම් බදු අයකිරීම සඳහා යෙදවිය හැකි බව ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය විසින් දන්වා ඇති බැවින් , ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින්, ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති 2008.05.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන සභාව විසින් නම් කරනු ලබන නිලධාරීන්ට මාස 02 ක කාලයකට රාජකාරි වේලාවෙන් බැහැර සහ නිවාඩු දිනවල කොමිස් පදනම මත වරිපනම් බදු එකතු කිරීම සඳහා යෙදවීමට තීරණය කරන ලදී.

වරිපනම් බදු එකතු කිරීමේ ( 2007.12.31 දිනට ) කුඩා ශේෂයේ සිට ඉහල හිඟ ශේෂය දක්වා අයකලයුතු බවත් , සියළුම හිඟ මුදල් වාරික කාර්යාලය වෙත ලැබුණු පසු පමණක් කොමිස් මුදල ගෙවීම සුදුසු බවට වැඩිදුරටත් තීරණය කරන ලදී.

5:23 **සමගි මාවත කාණුව වැසීම:**

ඉහත කී කරුණට අදාළව, බලන්ගොඩ සමගි මාවත ගම්වාසීන් විසින් ඉදිරිපත් කර ඇති 2008.03.29 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

සමගි මාවත අමරපාල මහතාගේ නිවස අසලින් පහලට වැසිජලය බසින කාණුව කසල දමා වසා ඇති බැවින්, වැසිදිනවල එම මාර්ගයේ ගමන් කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවත්, මේ සම්බන්ධව පරීක්ෂා කර බලන ලෙසත්, මෙම මාර්ගයේ බර වාහන ගමන් කිරීම නිසා මාර්ගය පලුදුවීම නිරන්තරයෙන් දක්නට ලැබෙන බව එහි සඳහන් කර තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, කාණුවට කසල නොදමන ලෙසට උපදෙස් ලබාදීමටත්, කාණුව සකස් කිරීම සඳහා වැඩ අධිකාරී මහතා මගින් ඇස්තමේන්තුවක් සකස් කිරීමටත් තීරණය කරන ලදී.

5:24 **කසල බද්දෙන් නිදහස් කිරීම**:

නගර සභාව මගින් දැනට පනවා ඇති කසල බද්දෙන් යම් ආයතනයක් නිදහස් කිරීමට නම් එම ආයතනය පහත කරුණු සම්පූර්ණ කලයුතු අතර, ඒවා සම්පූර්ණ කර ඇති බවට මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ තීරණයක් මත එම බද්දෙන් නිදහස් කිරීම කල හැකි බව දන්වමින්,මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. සෑම ආයතනයක් තුළම වසා තැබිය හැකි හොඳ වර්ගයේ කසල බඳුන් 02 ක් අවට තැබීම.
02. එම බඳුන් 02 ක් " දිරන කසල " හා " නොදිරන කසල " ලෙස නම් කිරීම.
03. නොදිරන කසල බඳුනට පොලිතීන්,කඩදාසි,යකඩ ,ටින් ප්ලාස්ටික්,පොල්කටු ,කාඩ්බෝඩ් යනාදී ද්‍රව්‍ය එකතු කිරීම. ඒවා නගර සභාවේ මධ්‍යස්ථානයට ගෙනවිත් අලෙවි කිරීම.
04. මාර්ගයට කසල නොදැමීම.
05. ලන්ච් ෂීට් භාවිතා නොකිරීම.
06. අප ජලය කාණු වලට නොදැමීම.

ඉහත කරුණු සම්පූර්ණ කර ඇති බවට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් නිර්දේශ කරන යම් ආයතනයක් වේ නම්, එම ආයතනය කසල බද්දෙන් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

5:25 **වරිපනම් අංශය සඳහා තක්සේරු නිවේදන:**

වරිපනම් අංශය සඳහා තක්සේරු නිවේදන 30000 ක් පමණ මුද්‍රණය කරවා ගැනීම සුදුසු බව වාර්තා කරමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

5:26 **බස්නැවතුම්පලේ කඩකුලී අය නොවීම:**

ඉහත කරුණට අදාළව විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, දඩ මුදල් අයකිරීමේ දී මාසයක් කාලයක් තුළ ගෙවීම් කිරීමේ දී අදාල කඩ කාමර වල දඩ මුදල් අයනොකර කුලිය පමණක් අයකිරීමට තීරණය කරන ලදී.

5:27 **බස්නැවතුම්පලේ බස්රථ වලින් ගාස්තු අයකිරීම:**

දැනට බස්නැවතුම්පලේ බස් රථ වලින් අයකරනු ලබන නැවතුම් ගාස්තු මුදල රු.50/- දක්වා වැඩිකර බස්රථ රියදුරන්ට හා කොන්දොස්තරවරුන්ට නොමිලයේ වැසිකිලි පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ආදායම් අංශයෙන් වාර්තා කර ඇති බව ලේකම් මහතා සභාව වෙත දැණුම් දෙන ලදී.

මේ පිළිබඳව සාකච්ජා කල සභාව , බස්නැවතුම්පල පිරිසිදු කිරීමේ වියදම් අවම මටමින් පවත්වා ගැනීම සඳහා 2008.06.01 දින සිට පෞද්ගලික බස් රථ නැවතුම් ගාස්තු , එක් බස්රථයකින් රු.50/- ක් අයකිරීමට තීරණය කරන ලදී. පෞද්ගලික බස් රථ සංගමයේ රියදුරු හා කොන්දොස්තර මහත්වරුන්ට පරිහරණය සඳහා නොමිලයේ සනීපාරක්ෂක පහසුකම්(වැසිකිලි) ලබාදීමටත්, ඔවුන් විසින් එම වැසිකිලිය නඩත්තු කිරීමේ වගකීම භාරගත යුතු වන බවද දැණුම්දීමට තීරණය විය.

- පෞද්ගලික බස් රථ වලින් නැවතුම් ගාස්තු අයකිරීම සඳහා පත්කර ඇති එම්. පියසේන මහතාට ගෙවනු ලබන කොමිස් මුදල 15% දක්වා අඩුකිරීමට වැඩිදුරටත් තීරණය විය.

5:28 **විදුලි රැහැන් ඇදීම සඳහා නගර සභා කාර්යාල පරිශ්‍රයේ පිහිටි ගස් කිහිපයක් ඉවත්කිරීම:**

ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු සබරගමුව විසින් මේ සම්බන්ධව දන්වා එවා ඇති 2008.04.25 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

එම ලිපියෙන් කපා ඉවත් කිරීමට දැණුම් දී ඇති ගස් ප්‍රමාණය මිළ ගණන් කැඳවා කපා ඉවත් කිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම:** ( රු.10000/- ට වැඩි )

2008.04.21 දින සිට 2008.05.29 දක්වා ගෙවන ලද රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

01. දේශීය ආදායම් කොමසාරිස්,රැදවුම් බදු පේෂණය කිරීම — රු.42902.31
02. එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්
   කර්මාන්ත අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම — රු.13699.00
03. ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්
   දු.අ.2287023 -2008 පෙබරවාරි
   2287022 - ජනවාරි
   2287024 පෙබරවාරි
   060-2452931 පෙබරවාරි
   060-2452932 ජනවාරි
   2288400 ජනවාරි/පෙබරවාරි — රු.26507.55
04. දේශබන්දු සුරියපටපැදි
   අංක:2908,14606,14605 නඩු සඳහා අධිකරණයේ
   පෙනී සිටීම. — රු.24000.00
05. ලාහිර් සන්ස්
   colour Boots ජෝඩු 16 ක් ලබාගැනීම — රු.22176.00
06. ඥාණසීලි දිසානායක
   ඔලුගන්තොට 29/ඒ 2 දරණ නිවස සඳහා තැන්පත් කල
   ගෙවල් කුලී ආපසු ගෙවීම. — රු.48450.00
07. ඩක්ස් ඉංජිනියරින්ස්
   බොබි කැටි යන්ත්‍රයේ 03 වාරිකය ගෙවීම — රු. 796500.00

08. සාමාන්‍යාධිකාරී,ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය රු. 47957.20
-එම- රු. 56149.20
-එම- රු. 75735.20
2008.03.27 සිට 2008.04.11 දක්වා ඉන්ධන බිල්පත් පියවීම.
09. ටී.එච්.තෙබුවන
ජී.කේ.1483 දරණ ට්‍රැක්ටරය අ.වැ.කිරීම. රු.30294.00

10. එල්.ටී.සී.සී.මෙටල් ක්‍රෂර්
4x4 ගල් කියුබ් 09 ක් මිලදී ගැනීම රු. 31035.00
11. සිටි ටිම්බර් ඩිපොට්
කර්මාන්ත අංශය සඳහා ගොඩගැනිලි ද්‍රව්‍ය ලබාගැනීම රු. 26314.20
12. පතිරණ ඉලෙක්ට්‍රිකල්ස්
ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ කඩපෙල වයරින් කිරීම සඳහා විදුලි උපකරණ මිළදී ගැනීම රු. 54652.54
13. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ
2007 වර්ෂයේ පෙබරවාරි මස බිල්පත හිඟ ගෙවීම රු. 53165.07
14. කැළණි ඒජන්සීස්
කොන්ක්‍රීට් මිශ්‍රයන් ලබාගැනීම රු. 211500.00
15. බී.ගුණරත්න
නගරයේ කැලි කසල ඉවත් කිරීම රු. 111427.34
16. ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්
2008 පෙබරවාරි/මාර්තු දුරකථන බිල් පියවීම රු. 31379.79
17. සාමාන්‍යාධිකාරී/සී.ස.ඉඹුල්පේ වි.සේ.ස.
2008.04.04 සිට 2008.04.22 දක්වා ඉන්ධන බිල්පත් පියවීම. රු. 78629.40
18. එච්.බී.ගුණරත්න
වැලි කියුබ් 07 ක් මිලදී ගැනීම රු. 28836.00
එච්.බී.ගුණරත්න
වැලි කියුබ් 09 ක් මිලදී ගැනීම රු. 32076.00
19. ටී.කේ.සී.මුවංගල
කර්මාන්ත අංශය සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාගැනීම රු. 29870.28
20. බිස්නස් ෆෝර්ම්ස් ලිමිටඩ්
කසල බදු පිළිබඳ දැන්වීම් පත්‍රිකා මුද්‍රණය කිරීම රු. 22018.59
21. ටී.කේ.සී.මුවංගල
සිමෙන්ති මිටි 275 ක් මිලදී ගැනීම රු. 202706.40
22. එල්.ටී.සී.සී.මෙටල් ක්‍රෂර්
4x4 ගල් කියුබ් 19 මිලදී ගැනීම රු. 60011.00
23. එල්.ටී.සී.සී.මෙටල් ක්‍රෂර්
ගල් කියුබ් 10 ක් මිලදී ගැනීම. රු. 49480.20
24. බී.ගුණරත්න මහතා
2008.05.01 සිට 2008.05.16දක්වා නගරයේ කැලි කසල ඉවත් කිරීම. රු. 86500.00
25. සාමාන්‍යාධිකාරී සී.ස.ඉඹුල්පේ වි.සේ.ස.
2008.05.02 සිට 2008.05.06 දක්වා ඉන්ධන බිල්පත් පියවීම. රු. 97247.00
26. ටොයෝටා ලංකා පුද්ගලික සමාගම
එන්.ඩී.5124 වාහනය සේවා කටයුතු කිරීම. රු. 23101.79
27. සෙන්ට්‍රල් පොලිසැක්ස් පුද්.සමාගම
ඝන ඇසුරුම් මධ්‍යස්ථානයේ පොහොර ඇසුරුම් කිරීම රු. 102150.00
28. ටී.කේ.සී.මුවංගල
සිමෙන්ති මිටි 385 ක් මිලදී ගැනීම. රු. 285901.00
29. කැළණි ඒජන්සීස්
පොහොර ව්‍යාපෘතියට අඟල් 2 වතුර පොම්පයක් මිලදී ගැනීම. රු. 13477.72

30. නිව් ජෝති ස්ටෝර්ස්
පෙර පාසලේ අවුරුදු උත්සවය වෙනුවෙන් ළමා කුඩ
70 ක් මිලදී ගැනීම. රු. 14000.00
31. එම්.ජී.පියසේන
පෞද්ගලික බස්ගාල් ගාස්තු වලින් තැන්පත් මුදල් ආපසු
ගෙවීම. රු. 15756.70
32. සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන්
තාර මිලදී ගැනීම. රු. 60600.00

37. එන්.බී.ගුණරත්න රු. 33840.00
-එම- රු. 33840.00
වැලි කියුබ් 20 ක් සැපයීම.
38. එල්.ටී.සී.සී.මෙටල් ක්‍රෂර රු. 85352.00
-එම- රු. 42300.00
නගර සභාවේ කර්මාන්ත සඳහා අවශ්‍ය කලු ගල්
මිලදී ගැනීම.
39. ටී.ජී.චන්ද්‍රරත්න රු. 10000.00
කොම්පෝස්ට් ව්‍යාපෘතියේ පොහොර හැලීම වෙනුවෙන්
කි.1 කට රු.1/- බැගින් කි.10000
40. ජයන්ති ටයර් වර්ක්ස්
ජී.10 1483 දරණ රථයට ceat වර්ගයේ
ටයර් 02 ක් මිලදී ගැනීම. රු. 128000.00
41. සාමාන්‍යාධිකාරී.සී.ස.ඉඹුල්පේ වි.සේ.ස. රු. 9044.20
-එම- රු. 54122.60
2008.04.21 සිට 2008.05.12 දක්වා ඉන්ධන බිල්පත්
පියවීම.

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීම:**

සභාවට ලැබී ඇති පහත සදහන් ඇස්තමේන්තු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

01.බැංකියවත්ත කොම්පෝස්ට් ගොඩනැගිල්ලේ
29'x6' පැරණි වහලය ගලවා අලුතින්
බඩු සපයා වහල ගැසීම සහ පැරණි වහලය
ප්‍රිමෙක්ස් යාඩ් එකට සම්බන්ධකර සවිකිරීම,
කාර්යාලයේ ඉදිරිපිට මල් ආවරණය සැකසීම
සඳහා වියදම් ඇස්තමේන්තුව රු. 458000.00

ඇස්තමේන්තුව අනුමත කල සභාව, සභා අරමුදලින් මෙම කර්මාන්තය ඉටුකිරීමට තීරණය කරන ලදී.

02. බලන්ගොඩ නගර සභා නේවාසික උඩුමහල වැසිකිලිය
ඉදිකිරීම කර්මාන්තය,වහල වෙනස් කිරීම සඳහා යන
වියදම් ඇස්තමේන්තුව රු. 49629.16

ඇස්තමේන්තුව අනුමත කල සභාව, සභා අරමුදලින් මෙම කර්මාන්තය ඉටුකිරීමට තීරණය කරන ලදී.

03. මුගුණමලේ පාර කොන්ක්‍රීට්කර සංවර්ධනය කිරීමමෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ඇත්තේ දිග අඩි 300 ක්,'අඩි 10 පළල සිටින ලෙසත් , අඩි දිග 100 ක්, අඩි 12 පළලසිටින ලෙසත්ය. දිග අඩි 100 පළල කොටස දිග 100 ඉක්මවායන ලෙසත්,පළල අඩි 21'-6" පමණ වන සේ පළල සකස් කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් දී කාර්යය කිරීමට කටයුතු කරන ලදී. එබැවින්, ඇස්තමේන්තු මුදල් සීමාව ඉක්මවායා හැකි බැවින්, සභා අරමුදල් යෙදවීම සිදුවිය හැකි බැවින්, ඒ සම්බන්ධව උපදෙස් පතා ඇති බව ලේකම් මහතා සභාව වෙත දැණුම් දෙන ලදී.

අතිරේක මුදල් සභාවෙන් යෙදවීමට තීරණය කරන ලදී.

08. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ : නැත
යථා පරිදි කල්දී ඇති යෝජනා: නැත

09. **<u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම:</u>**
**<u>ගංගා වැලි සැපයීම:</u>**
බලන්ගොඩ,කල්තොට ,දික්පිටිය යන ලිපිනයේ පදිංචි එච්.බී.ගුණරත්න යන අය බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත සඳහා ගංගා වැලි සැපයු බවත්, වර්තමානයේ වෙළඳපලේ ඉන්ධන මිල ඉහල යාම හමුවේ පැරණි මිළට වැලි සැපයිය නොහැකි බවත්, එම නිසා වැලි කියුබ් 01 කට රු.4000/- ක මුදලක් ලබාදෙන ලෙස උක්ත ලිපියෙන් ඉල්ලා ඇති අතර නගර සභාවේ කර්මාන්ත

සඳහා ගල් සැපයීමට ලියාපදිංචි වී සිටින වසන්ත කුමාර මහතා ද පැරණි මිලට ගල් කියුබ් සැපයිය නොහැකි බව දන්වා ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කර සිටින ලදී.

සභාවේ කර්මාන්ත සඳහා අවශ්‍ය වන ගල් සහ වැලි මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවා අවම මිළ පිළිගෙන අදාල සේවාවන් ලබාගැනීමට තීරණය කරන ලදී.

10. **<u>යෝජනා:</u>**

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනාවන් සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු සභාපති,ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා:</u>**

01. **<u>සභාවට අවශ්‍ය සිමෙන්ති ලබාගැනීම:</u>**

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනාව සභාව වෙත ඉදිරිපත් කරන ලදී. කර්මාන්ත ඉටුකිරීම සඳහා සිමෙන්ති ලබාගැනීමේ දී රැඳවා ගැනීමේ බදු හා පිරිවැටුම් බදු අයකිරීම හේතුවෙන් සිමෙන්ති මිලදී ගැනීමට යාමේ දී මෙම සභාව මහත් දුෂ්කරතාවයනට මුහුණපානු ඇත. මේ සඳහා පිලියමක් වශයෙන් ඇල්ට්‍රාටෙක් සෙලින්කෝ සමාගමේ සිමෙන්ති නියෝජිත ආයතනයක් ලෙස මෙම සභාව ලියාපදිංචිවීම සුදුසු බවටත්, එමගින් සභාවට අවශ්‍ය සිමෙන්ති පවතින මිළට ලබාගැනීමට හැකි බවත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

02.කාර් නැවතුම් ස්ථානය අසලින් නව බස්නැවතුම්පලට පිවිසීම සඳහා ඇති මාර්ගය දෙපස සාප්පු කඩ ඉදිකිරීම,එම ගොඩනැගිල්ලේ උඩු මහල නීතීඥ මහතුන් සඳහා ලබාදීම,ඉතිරිදෙපස පදික වෙළඳුන්ට සිය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ලබාදීම.

බිම් මහලේ කඩ කාමර ව්‍යාපාරික මහතුන්ට ටෙන්ඩර් මගින් ලබාදීම සුදුසු බවට ගරු උපසභාපතිතුමා දන්වන ලදී.

03. මෙම කාර්යාලයේ නිලධාරිණියන්ට හට අත්යන්ත්‍රානුසාරයෙන් සකස් කරන ලද (හැන්ලුම් සාරි ) නිල ඇඳුමක් ලබාදීම ද, නිලධාරීන් ද නිල ඇඳුමක් ලබාදීම.

04. බස්නැවතුම්පලේ ආදායම වැඩිකරගැනීම සඳහා සාකච්ජා කිරීම.

නව බස්නැවතුම්පලේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට ලබාදී ඇති කාර්යාල කාමර 02 නැවත නගර සභාව වෙත ලබාගැනීම පිණිස සාකච්ජා කිරීම සඳහා ඔවුන් කැඳවීමට තීරණය කරන ලදී.

ඉහත යෝජනා සියල්ල අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

11. **<u>ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම:</u>**
2008 වර්ෂයේ අප්‍රේල් මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තා ඉදිරිපත් කර තිබුණි.
පුනරාවර්තන ආදායම රු. 2699633.90

වෙනත් ලැබීම් රු. 1305532.94

-------------

රු. 4005166.84

========

පුනරාවර්තන වියදම් රු.2435260.76

වෙනත් ගෙවීම් රු. 973364.13

-------------

මුළු වියදම් රු.3408624.89

=========

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

**<u>පරිපූරක අයවැය -2008 වර්ෂය:</u>**

01. ප්‍රතිපාදන , ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය අලෙවිය:

| මුදල් යෙදවීම | වැය ශිර්ෂ |
|---|---|
| 2.0.362.1 ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය අලෙවිය රු.50000 | 2.9.435 මිලදී ගැනීම් රු.20000<br>2.9.439 වෙනත් 20000<br>2.9.459 වෙනත් (බැංකියවත්ත)<br>ටෙලිෆෝන් බිල 10000 |
| | 50000 |

මෙම පරිපූරක අයවැය සභාව විසින් අනුමත කරන ලදී.

12. **<u>කාරක සභාවල වාර්තා සලකා බැලීම:</u>**

12:01 2008-05.15 වන දින පැවැති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදුව එම වාර්තාව සභාව විසින් පිළිගන්නා ලදී.

12:02 බලන්ගොඩ නගර සභාවේ සුපිපි කවයේ 2008.05.09 දිනැති කව රැස්වීම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාවේ සදහන් 3 වන යෝජනාව ක්‍රියාත්මක කිරීම පිණිස මාස 03 කට වරක් එක් අයෙකුට ආපදා ණය මුදල් ලබාදීම සුදුසු බවට තීරණය විය.

12:03 2008 වර්ෂයේ මාර්තු මාසය තුළ බලන්ගොඩ නගර සභාවේ එක් එක් වාහන සදහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, එම වාර්තාව සභාව විසින් පිළිගන්නා ලදී.

13. **<u>වෙනත් කරුණු:</u>**

13:01 **<u>ගරු නගර සභා මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා:</u>**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, බලන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන් තෝරා එම අයට වැසිකිලි ආධාර ලබාදීම පසුගිය දා සිදුකල බවත්, එම වැඩ සටහන යටතේ බලන්ගොඩ ර/ශාන්ත ඇග්නස් බාලිකා මහා විද්‍යාලය වෙත හා බලන්ගොඩ සාංඝික පන්සලට වැසිකිලි ආධාර ලබාදීම සුදුසු යැයි තමන් යෝජනා කරන බව දැන්වීය. එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ඩබ්.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සදහා ගරු පළාත් පාලන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීමට සභාව තීරණය කරන ලදී.

බලන්ගොඩ වැලිහරනාව ප්‍රදේශයට ජලය ලබාදීම සදහා මාර්ගය පුළුල් කිරීම සිදුකර තිබෙන බවත්, එම නිසා වාහන ගමන් කිරීමට නොහැකිව තිබෙන නිසා ජනතාව දුෂ්කරතාවකට පත්ව තිබෙන බව පැහැදිලි කරන ලදී. වාහන ගමනා ගමනයට බාධාවක් නොවන ආකාරයට අදාල සංවර්ධන කාර්යය ඉටුකරන ලෙස ජල සම්පත් මණ්ඩලය වෙත දන්වා යැවීමටත්, මෙම මාර්ගය පුළුල් කර සංවර්ධනය කරදෙන ලෙස විෂය භාර ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කිරීමටත් සභාව තීරණය කරන ලදී.

13:02 **ගරු නගර සභා මන්ත්‍රී -ධර්මසේන සමරසිංහ මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බලන්ගොඩ හෙල බොදු ව්‍යාපාරික පදන විසින් පසුගිය වෙසක් උත්සවය නිමිතිකරගෙන වැඩ සටහන් රැසක් ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් ඉටුකල අතර, ඒ සඳහා නගර සභාවේ දායකත්වයද ලැබුණු බවත්, එම සත් කාර්යය වෙනුවෙන් හෙල බොදු ව්‍යාපාරික පදනමේ සභාපති වශයෙන් තමා මෙම සභාවේ ගරු සභාපතිතුමා,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සිය ස්තුතිපූර්වක ප්‍රණාමය මෙම අවස්ථාවේ දී පළකර සිටින බව දැන්වීය.

තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා, 2008.06.17/18 වන දිනට යෙදෙන පොසොන් පුන් පොහොය නිමිති කරගෙන බලන්ගොඩ සමාජ සේවා පදනම බලන්ගොඩ පොදු වෙළඳසල ගොඩනැගිල්ලේ මහා බත් දන්සැලක් පැවැත්වීමට අදහස් කරගෙන සිටින බවත්, ඒ සඳහා පොදුවෙළඳසල ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කර පවිත්‍ර කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී. (අදාල කාර්යය ඉටුකරදීමට ගරු සභාපතිතුමා සිය එකගතාව පළකරන ලදී.)

කුමාරගම පල්ලෙකුඹුර මාර්ගයේ පැති බැම්ම කැඩී ඇති බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා එය සකස් කරදෙන ලෙසත්, බලන්ගොඩ පරණ පාර හා වීරසුන්දරාරාම පාර ප්‍රතිසංස්කරණය කලයුතු බැවින්, ඒ කෙරෙහි ද අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

( ගරු මන්ත්‍රීතුමා සඳහන් කල මාර්ගයේ පැති බැම්ම සැකසීම සඳහා ගල්/වැලි/සිමෙන්ති ලබාදිය හැකි බවත්, ප්‍රදේශයේ ජනතාවගේ ශ්‍රමදායකත්වය ලබාගෙන මෙම සංවර්ධනය කාර්යය ඉටුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා වෙත ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.)

තවදුරටත් කථා කල ගරු මන්ත්‍රිතුමා, මෙම නගර සභාව මගින් කුමාරගම ප්‍රදේශයේ ලිදක් ඉදිකල අතර, එම ස්ථානයට පිවිසීම සඳහා පඩිපෙලක් සකස් නොමැති බැවින්, එය සකස් කිරීමට ද සභාවේ අවධානය යොමු කරන ලදී.

ජේයිකා ආධාර යටතේ නගරයේ කාණු පද්ධතිය ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බව අද දින දැනගැනීමට ලැබුණු බවත්, ඒ සම්බන්ධව සිය සතුට පළකරන ලදී.

බලන්ගොඩ නගරය ඉතා සීඝ්‍රයෙන් දියුණුවන නගරයෙක් වන අතර, මෙම නගරයට විශාල අඩුපාඩුවක් තිබෙන වාහන නතර කිරීමේ ස්ථානයක් සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

ලෝකයේ දියුණු සහ ප්‍රබල රටවල් අභිබවමින් , රටවල් 193 ක සාමාජිකයින් අතරින් ගරු සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ලෝක සෞඛ්‍ය සංවිධානයේ සභාපති තනතුරට පත්වීම ශ්‍රී ලංකාවට මහත් අභිමානයක් බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමා, මෙරට සහ ජාත්‍යන්තර වශයෙන් සෞඛ්‍ය ක්ශේත්‍රයේ කිරතිමත් මෙහෙවරක නිරතවීමේ ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය කේෂ්ත්‍රයේ ලොව ඉහළම පිළිගැනීමක් ඇති ලෝක සෞඛ්‍ය සංවිධානයේ සභාපති තනතුරට ගරු නිමල් සිරිපාලද සිල්වා මැතිතුමා පත්වීම සම්බන්ධව බලන්ගොඩ නගර සභාවේ සුභාශිංසනය පළකිරීමට යෝජනා කරන ලදුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13:03 **ගරු නගර සභා මන්ත්‍රී-ඩබ්.විමලසේන මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, නගරයේ පහත සඳහන් ස්ථානයන්හි විවී පහන් නොමැති බැවින් එම ස්ථාන වලට විවී පහන් සවිකිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

නගරයේ කාණු පද්ධතිය සැකසීමේ දී අප ජලය පෙරීයාම සඳහා කාණු පද්ධතියේ අවසන් කෙළවරයට පිල්ටරයක් යෙදීමට කටයුතු කරන බව එම ඉදිකිරීම් සිදුකල සමාගම විසින් දන්වා සිටියද එය සකස් කර නොමැති බව පෙන්වාදෙන ලදී.

2008 පෙබරවාරි මස මාසික මහ සභා රැස්වීමේ තිරණ අංක: 05:10 ප්‍රකාරව, ස්වංරැකියාවක් ලෙස ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා කොළඹ-බදුල්ල නව අතුරු මාර්ගය හා දොරවෙල ඔය අතර පිහිටි බිම් තීරය පුද්ගලයින් දෙදෙනෙකුට දීර්ඝ කාලීනව බදු ලබාදීමට තීරණය කර ඇති බවත්, සභාව සතු දේපල ඉතා සුළු මුදලකට බදුදීමෙන් සභාවට විශාල පාඩුවක් සිදුව තිබෙන බව පැවසීය. මින් ඉදිරියේ දී හෝ සභාව සතු දේපල බදු දීමේ දී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර බදු ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

( ගරු සභාපතිතුමා කථා කරමින්, ඉදිරියේ දී නගර සභාව සතු සියළු ඉඩම් හදුනාගෙන බදුලබාදීම එම දේපල වලින් සභාව වෙත ආදායම ලබාගැනීමට කටයුතු කරන බවත්, උක්ත දේපල බදුදීම සදහා සබරගමුව පලාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අදාල දේපල තක්සේරු කරවාගෙන, එම තක්සේරු වාර්තාව පදනම් කරගෙන නීත්‍යානුකූල ආකාරයට අදාල අයට බදු ලබාදුන් බව දන්වන ලදී.)

13:04 **ගරු නගර සභා මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා:**
ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයන් මත දිවයින පුරා සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වන බවත්, එක්සත් ජාතික පක්ෂය මේ රට පාලනය කල කාලයට වඩා වැඩි සංවර්ධනයක් මේවන විට සිදුව ඇති බවත් පැවසීය.

විශේෂයෙන් ජාතික සවිය , ගම නැගුම,මග නැගුම වැනි සංවර්ධන ව්‍යාපෘතීන් අගය කලටයුතු වන අතර, ග්‍රාමීය නායකයින්ට තමන් නියෝජනය කරනු ලබන ප්‍රදේශවල සංවර්ධන කටයුතු ඉටුකරගැනීමට මෙමගින් අවස්ථාව උදා වී තිබෙන බව දැන්වීය. බලන්ගොඩ ප්‍රදේශයේ ද මේවන විට විශාල සංවර්ධනයක් මෙම ව්‍යාපෘති හරහා සිදුව තිබෙන අතර, තමන් නියෝජනය කරන දෙහිගස්තලාව ප්‍රදේශයේ ද විශාල සංවර්ධනයක් සිදුව තිබෙන බවත්, හිටපු එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.එල්.එම්.අබුසාලි මැතිතුමා එම ධුරයේ සිටි කාලයේ දීවත් මෙවැනි සංවර්ධනයක් නොවුන බව පැවසීය. මෙවැනි විශාල සංවර්ධනයක් සිදුකරගෙන යන අවස්ථාවේ දී මෙම සභාවේ එක්සත් ජාතික පක්ෂයේ ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා තමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වය ලබාගැනීමට කටයුතු කරන බවට අසත්‍ය ප්‍රකාශයක් කර තිබෙන බවත්, මෙම ප්‍රකාශය බලන්ගොඩ ප්‍රදේශයේ දේශපාලන නායකයින් වෙතද දැනගැනීමට ලැබී තිබෙන බවත්, ඔවුන් ඒ පිළිබඳව තමාගෙන් විමසූ අතර, එම අවස්ථාවේ දී තමා දැඩි අපහසුතාවකට ලක් වූ බව ප්‍රකාශ කරන ලදී. මින් ඉදිරියේ දී හෝ මෙවැනි අසත්‍ය ප්‍රකාශයන් සිදුනොකරන ලෙස ඉල්ලා සිටින බව සදහන් කරමින් සිය කථාව අවසන් කරන ලදී.

13:05 **ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**
ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, පිට ප්‍රදේශවලින් බලන්ගොඩ නගරයට පැමිණෙන ජනතාව බලන්ගොඩ නගරයේ ක්‍රමවත්භාවය , අලංකාරය සම්බන්ධව ඉතා සතුටින් යුතුව අදහස් ප්‍රකාශ කරන බවත්, බලන්ගොඩ නගරය ජනතාව අතර එවැනි ඇගයීමකට ලක්වීම සම්බන්ධව අප සියළු දෙනාටම කණ්ඩායමක් ලෙස සතුටට පත්විය හැකි අතර, විශේෂයෙන් ගරු සභාපතිතුමා බලන්ගොඩ නගරය සම්බන්ධව දක්වනු ලබන කැපවීම අප ඉතා අගය කරන බව පැවසීය.

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් ජාතික සවිය ගම නැගුම ව්‍යාපාතිය කෙරෙන සංවර්ධන කටයුතු සදහා යටතේ 50% ක ශ්‍රමදායකත්වයක් ලබාගත යුතු බවට කොන්දේසියක් පනවා ඇති අතර, එම තීරණය අනුව කටයුතු කිරීම අපහසු නිසා, ගරු සභාපතිතුමා කිරිමැටිතැන්න වසමේ ජාතික සවිය යටතේ ඇරඹීට අදහස් කරන ව්‍යාපෘතියට නගර සභාව මගින් ගල්,වැලි,කොන්ක්‍රීට් මිශ්‍රකය ලබාදීමෙන් දායකත්වය ලබාදෙන බව දැනගැනීමට ලැබී තිබෙන බවත්, එම වසමට පමණක් එවැනි වරප්‍රසාදයක් ලබාදීම සම්බන්ධව සිය විරුද්ධත්වය ප්‍රකාශ කර සිටින බව දැන්වීය. ජාතික සවිය ගම නැගුමේ ව්‍යාපෘතිය යටතේ වසම් 11 ක් නගර සභාව සීමාවට අයත්ව ඇති බැවින්, එම ව්‍යාපෘති සදහාත්, ඒ අවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙන්නේ අන් සියලු වසම් වලටත් සාධාරණයක් ඉෂ්ඨ වන බව ප්‍රකාශ කර සිටින ලදී.(මෙම වැඩ සටහන යටතේ තම තමන් නියෝජනය කරනු ලබන සංවර්ධන යෝජනා සම්බන්ධව සාකච්ජාවක් පවත්වා අදාල වාර්තාව සභාව වෙත ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා වෙත දැනුම් දී තිබෙන බවත්, එසේ සිදුනොකර සභාව වෙත චෝදනා කිරීම සම්බන්ධව තමා කණගාටුවන බව ගරු සභාපතිතුමා දැන්වීය.)
කුමාරගම පන්සලට ප්ලාස්ටිසල් ලීටර් 1000 වතුර ටැංකියක් සහ අවශ්‍ය වන බට ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

බලන්ගොඩ,කෙළින් වීදිය, අංක: 17/1 දරණ ලිපිනයේ පදිංචි එච්.පී.කේ.හිමාලී කෞෂල්‍යා ා යන අය ර/බලන්ගොඩ විද්‍යාලෝක මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක් වන අතර, මැය ජුලි 01 දින සිට 04 දින දක්වා ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පැවැත්වෙන නෙට්බෝල් තරගාවලිය සදහා සහභාගීවීමට සුදුසුකම් ලබා ඇති බවත්,ඒ සදහා නගර සභාව මගින්යම් දායකත්වයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කර තිබු බවත්, එම ඉල්ලීම සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන ලෙස තමන් ද ඉල්ලීමක් කල බවත්, ඒ අනුව රු.10000/- ක දායකත්වය ලබාදීමට අද දින සභාව තීරණය කල බවත්, ඒ සම්බන්ධව තමා සතුටු වන බව පැවසීය.

බුද්ධ ජයන්ත පාර අබලන්ව පවතින බැවින්, එය සකස් කරදෙනලෙසත්, දෙණියකුඹුර පාර සම්බන්ධව කාලයක සිට පැවැති ගැටළුව සමතයකට පත්කර එය සංවර්ධනය කරදීමට කටයුතු කිරීම සම්බන්ධව ද තමගේ ස්තුතිය ගරු සභාපතිතුමා වෙත පළකර සිටින බව දැන්වීය. තවදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා, පොසොන් පුන් පොහොය නිමිතිකරගෙන වාර්ෂිකව බලන්ගොඩ නගරයේ මිහිඳු මහ පෙරහැරයක් පැවැත්වෙන බවත්, මෙවර ද එම පෙරහැර පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති බව දැනගැනීමට ඇති තිබෙන බවත්, එම නිසා මිහිඳු මහ පෙරහැරට සභාවෙන් අවශ්‍ය වන දායකත්වය ලබාදීමට අවධානය යොමුකරන ලෙස ද ඉල්ලා සිටින ලදී.

වර්තමානයේ මුළු ලෝකයම ඉන්ධන අර්බුදයකට ලක්ව තිබෙන බවත්, එම නිසා අනවශ්‍ය ආකාරයට ඉන්ධන පාවිච්චි නොකර , අරපිරිමැස්මෙන් යුතුව ඉන්ධන පාවිච්චි කිරීමට අපිද පුරුදුවෙමු යැයි පවසමින් සිය කථාව අවසන්කරන ලදී..

13:05 **<u>ගරු නගර සභා මන්ත්‍රී-ඩබ්.නිමල් කරුණාරත්න මැතිතුමා:</u>**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, කිරිදිගල ගගට බසින ස්ථානයේ විශාල කුඩු දවුල ගසක් පිහිටා තිබෙන බවත්, එම ගස කපා දමා එම ස්ථානයේ ඇති පඩිපෙල සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව
අවසන් කරන ලදී.

13:06 **<u>අවසානය:</u>**

**<u>ගරු සභාපති-ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:</u>**
ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව කරගෙන යාමට සහයෝගය ලබාදුන් ගරු උපසභාපතිතුමා,ගරු මන්ත්‍රීතුමන්ලා හා ලේකම්තුමා වෙත සිය ස්තුතිය ප්‍රකාශ කරමින්,ප.ව.2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

2008.06.17
බළන්ගොඩ නගර සභාවේ දී ය.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.